# ථෙරවාද භික්ෂු සම්ප්‍රදාය හා එහි විනය පිළිබඳ අවධානය

පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි

## 1. ප්‍රවේශය

බෞද්ධ චින්තනයට මෙන් ම ඉන් උපන් සංස්කෘතික සම්ප්‍රදායට ද ඇත්තේ දිග ඉතිහාසයකි. සියවස් විසිපහ ද ඉක්මවා ගිය එම ඉතිහාසය තුළ එය දෙයාකාරයෙකින් පෙනී සිටියි. එනම් ආදි බුද්ධසමය හා නිකායාන්තර බුද්ධසමය යනුවෙනි. මුල් බුද්ධසමය හෙවත් නම් ආදි බෞද්ධ චින්තනය ලෙස සැලකෙනුයේ බුදුන් වහන්සේගේ දේශනාවන්හි මූලික අභිප්‍රායයන් ප්‍රකට වන, වඩාත් ම පැරණි යැයි සැලකිය හැකි, එසේ මැ පසුකාලීන විවිධ ගොණු කිරීම, එක් කිරීම, අර්ථකථනයන්, සංග්‍රහ කිරීම් ආදියෙන් තොර වූ බෞද්ධ මූලාශ්‍රය සමූහයෙහි හමුවන ඉගැන්වීම් පද්ධතියයි. එම බුද්ධ දේශනාවන්හි ප්‍රමුඛතම අභිප්‍රාය වන්නේ මානව වර්ගයා හමුවෙහි ඇති මූලික ම ගැටලුව ලෙසත්, සාංසාරික පැවැත්මෙහි යථාර්ථය ලෙසත් හැඳින්විය හැකි දුක පිළිබඳ අවදිකම ප්‍රජාව තුළ ඇති කරලීමත්, දේශ කාල ජාති වශයෙන් විෂමතා රහිත වූ එකී දුක්කරතාවයෙන් අත්මිදීම පිණිස වන ආචාර විද්‍යාත්මක වූත්, මනෝවිද්‍යාත්මක හා ඥාන මීමාංසාත්මක වූත් ත්‍රිවිධ ශික්ෂා සංඛ්‍යාත පිළිවෙත් මාර්ගය පෙන්වා දීමත් ය.[1] කිසියම් තාර්කික තව්‍යතා රාමුවක් තුළ පරවාද මර්ථනයත් සකවාද මණ්ඩනයත් උදෙසා වන දර්ශනික පද්ධතියක් ගොඩනැගීමේ අපේක්ෂාවක් ප්‍රකට නොවන උක්ත අභිප්‍රාය මැ පෙරදැරි කරගත් මූලික ඉගැන්වීම් සමූහය ආදි බුද්ධසමය නම් වෙයි. දැනට බෞද්ධයන් සතු ව ඇති පුළුල් මූලාශ්‍රය පද්ධතියෙහි වඩාත් ම පැරණි යැයි සැලකෙනුයේ තුන් පිටකයයි. එයින් ද සූත්‍ර පිටකය මූලික ද පෞරාණික ද වේ. පසුකාලීන ව නොයෙක් නයින් සංවර්ධනය වී ඇතැයි හෙළිවන නමුදු පාලි සූත්‍ර පිටකයෙහි මුල් නිකාය සතර බොහෝ දුරට ආදි බුද්ධසමය හෙළි

---

© පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, ගොඩෙනිල්ලේ රහුල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.